සියලු ම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved]*

27051

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 1994 අගෝස්තු
General Certificate of Education (Adv. Level) Examination, August 1994

| 06 | සත්ත්ව විද්‍යාව I<br>ZOOLOGY I | S / I | පැය දෙකයි<br>*Two hours* |
|---|---|---|---|

උත්තර පත්‍රයේ දක්වා ඇති ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
මෙම පත්‍රයේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයීමට ඔබ වෑයම් කළ යුතුයි.

එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් ඇති නමුදු නිවැරදි පිළිතුරු ඉන් එකක් පමණකි. ප්‍රශ්නයට හොඳම පිළිතුර හැටියට ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගෙන පසු එය උත්තර පත්‍රයේ දක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න. වඩා පහසු ප්‍රශ්නවලට පළමුවෙන් පිළිතුරු දෙන්න. කිසියම් ප්‍රශ්නයක් අපහසු බව හැඟුණොත් එය මඟහැර කාලය ඉතිරි වුවහොත් දෙවනුව සලකා බැලීමට කල් තබන්න.

---

1. සෛලයක් තුළ ජීරණ එන්සයිම ගබඩා කර ඇත්තේ
   (1) ලයිසසෝම් තුළ ය. (2) රයිබොසෝම් තුළ ය. (3) අන්තඃප්ලාස්මීය ජාලිකා තුළ ය.
   (4) ගොල්ගි දේහ තුළ ය. (5) මයිටකොන්ඩ්‍රියා තුළ ය.

2. සත්ත්ව සෛලවල ගොල්ගි දේහ පිළිබඳ පහත සඳහන් ඒවා අතරෙන් අසත්‍ය වනුයේ කුමක් ද?
   (1) එය ස්‍රාවී සෛල තුළ හොඳින් විකසනය වී ඇත.
   (2) එය පටලමය ව්‍යුහයන්ගෙන් සමන්විත ය.
   (3) එය අන්තඃප්ලාස්මීය ජාලිකාව හා ආශ්‍රිත ව ඇත.
   (4) එය ග්ලයිකොප්‍රෝටීන සෑදීම සඳහා ප්‍රෝටීන හා කාබොහයිඩ්‍රේට එක් කරයි.
   (5) එය ග්ලයිකොජන් කණිකා ගබඩා කරයි.

3. පහත සඳහන් ස්ථාන අතරෙන් අනුනන විභාජනය වැඩියෙන් ම සිදුවන්නේ කොතැනහි ද?
   (1) චර්මය (2) බඩවැලෙහි අධිශ්ලේෂ්මලකය (3) ඇට මිදුළු
   (4) රුධිරය (5) ධූසර ද්‍රව්‍යය

4. අවකරණය සිදුවන්නේ
   (1) පළමු ප්‍රාක් කලාවේ දී ය. (2) පළමු යෝග කලාවේ දී ය.
   (3) පළමු වියෝග කලාවේ දී ය. (4) දෙවැනි ප්‍රාක් කලාවේ දී ය.
   (5) දෙවැනි යෝග කලාවේ දී ය.

5. සජීව පදාර්ථයෙහි ඇති විවිධ නියුක්ලියෝටයිඩ සංඛ්‍යාව වනුයේ
   (1) 2. (2) 4. (3) 5. (4) 8. (5) 10.

6. ප්‍රත්‍යස්ථ තන්තු බහුල ව ඇත්තේ
   (1) මේද පටකයේ ය. (2) පාරදෘශ්‍ය කාටිලේජයේ ය.
   (3) සුදු තන්තුමය කාටිලේජයේ ය. (4) කහ තන්තුමය කාටිලේජයේ ය.
   (5) සුදු තන්තුමය පටකයේ ය.

7. මිනිසාගේ සරල ඝනාකාර අපිච්ඡදය දක්නට ලැබෙන්නේ
   (1) පෙනහැලුවල ගර්තවල ය. (2) ගර්භාෂයෙහි එන්ඩොමෙට්‍රියමෙහි ය.
   (3) මුත්‍රාශ බිත්තියෙහි ය. (4) ක්ෂුද්‍රාන්ත්‍ර ආස්තරයෙහි ය.
   (5) වෘක්කාණුවෙහි විදූර සංවලිත නාලිකාවෙහි ය.

8. අස්ථිවල කෘත්‍යයක් නොවන්නේ පහත සඳහන් ඒවා අතරෙන් කුමක් ද?
   (1) දේහයට සංධාරණය සැපයීම. (2) රුධිරාණු නිපදවීම. (3) කැල්සියම් ගබඩා කිරීම.
   (4) අභ්‍යන්තර අවයව ආරක්ෂා කිරීම. (5) පේශි සවිවීම සඳහා පෘෂ්ඨ සැපයීම.

9. සංවලිත නාලාකාර ග්‍රන්ථියක් වනුයේ පහත සඳහන් ඒවා අතරෙන් කුමක් ද?
   (1) ස්තන්‍යස්‍රාවී ග්‍රන්ථිය (2) ආමාශයික ග්‍රන්ථිය (3) ස්වේද ග්‍රන්ථිය
   (4) බ්‍රූනර් ග්‍රන්ථිය (5) තයිරොයිඩ ග්‍රන්ථිය

10. වර්ගීකරණයේ දී වඩාත් ම සමීප බන්ධුතාවක් දක්වන සතුන් කාණ්ඩ කර ඇත්තේ
    (1) Phylum යටතේ ය. (2) Class යටතේ ය. (3) Order යටතේ ය.
    (4) Family යටතේ ය. (5) Genus යටතේ ය.

11. කශේරුවකින්, පිටසැකිල්ලකින් සහ දත් රහිත හිස්කබලකින් යුත් සැකිල්ලක් සත්ත්ව විද්‍යාඥයකුට හමු විය. මෙම සැකිල්ල දැරූ සත්ත්වයා අයත් වනුයේ
(1) Order Primates ට ය. (2) Order Artiodactyla ට ය. (3) Order Crocodilia ට ය.
(4) Order Chelonia ට ය. (5) Order Cetacea ට ය.

12. කෘමීන්ගේ දක්නට ලැබෙන පහත සඳහන් ලක්ෂණ අතරෙන් ක්‍රස්ටේසියාවන්ගේ දක්නට නොලැබෙන්නේ කුමක් ද?
(1) කයිටීනීය පිටසැකිල්ල (2) මැල්පිගීය නාලිකා (3) ඛණ්ඩකරණය
(4) ස්පර්ශක (5) සංයුක්ත අක්ෂි

13. *Homo sapiens* ගේ පමණක් දක්නට ලැබෙන්නේ පහත සඳහන් ලක්ෂණ අතරෙන් කුමක් ද?
(1) කැපී පෙනෙන නිකට (2) ඇඟිලිවල නිය පිහිටීම (3) දෙපාවත් බව
(4) විශාල මොළය (5) ද්විනේත්‍රික දෘෂ්ටිය

14. මිරිදිය ආකාර අන්තර්ගත නොවන්නේ පහත සඳහන් කුමන වංශයෙහි ද?
(1) Coelenterata (2) Echinodermata (3) Chordata (4) Mollusca (5) Annelida

15. පහත සඳහන් සතුන් යුගල් අතරෙන් වර්ගීකරණයෙහි දී වඩාත් ම සමීප බන්ධුතාවක් දක්වන්නේ කුමන යුගල ද?
(1) ගැඩවිලා සහ පත්පයා (2) මුහුදු ඇනිමනි සහ මුහුදු ඉකිරියා
(3) පටි පණුවා සහ කොකු පණුවා (4) ඉබ්බා සහ අලියා
(5) සමනලයා සහ වවුලා

16. කැරපොත්තාගේ
(1) මුඛ කොටස් විකීමට සහ ලෙවකෑමට විකරණය වී ඇත.
(2) ශ්වාසරන්ධ්‍ර උරතලවල පිහිටා ඇත.
(3) පළමුවන පාද යුගල ගොදුරු අල්ලාගැනීම සඳහා අනුවර්තනය වී ඇත.
(4) පිරිමි සහ ගැහැණු සතුන් බාහිරව වෙන් කර හඳුනාගත නොහැකිය.
(5) පූර්ව පියාපත් පක්ෂාවරණ සෑදීම සඳහා විකරණය වී ඇත.

17. කැරපොත්තා පිළිබඳ සත්‍ය වනුයේ පහත සඳහන් කුමන වගන්තිය ද?
(1) බිත්තර තනි තනිව දමයි.
(2) මොහු සර්වභක්ෂක ය.
(3) අවසාන පිළිරූ සිඟුවන්ට පියෑඹීමේ හැකියාව ඇත.
(4) මොහු ආලෝකයට ආකර්ෂණය වේ.
(5) මොහුට විශාල සරල අක්ෂි යුගලක් ඇත.

18. කැරපොත්තාගේ රුධිර පද්ධතිය පිළිබඳ ව පහත සඳහන් වගන්ති අතරෙන් **අසත්‍ය** වනුයේ කුමක් ද?
(1) රුධිරය විශාල රුධිර හෙබක් තුළ ඇත.
(2) පෘෂ්ඨීය නාලාකාර හෘදයක් ඇත.
(3) රුධිර ප්ලාස්මය තුළ ඔක්සිජන් සක්‍රියව පරිවහනය වේ.
(4) රුධිරය අවර්ණ ද්‍රවයකි.
(5) හෘදය තුළ රුධිරය ගලා යන්නේ පූර්ව කෙළවර දෙසට ය.

19. ගෙම්බා/මැඩියා පිළිබඳ සත්‍ය **නොවන්නේ** පහත සඳහන් වගන්ති අතරෙන් කුමක් ද?
(1) පිහිනීම සඳහා අනුවර්තනයක් ලෙස මොහුට ගෙලක් පිහිටා නැත.
(2) ආරක්ෂාව සඳහා සමෙහි විෂ ග්‍රන්ථි ඇත.
(3) අභ්‍යන්තර සංසේචනය සඳහා පිරිමි සහ ගැහැණු සතුන් යුගලනය වේ.
(4) පැනීමට උපකාරී වීම සඳහා කශේරුව කෙටි වී ඇත.
(5) කෘමීන් අල්ලා ගැනීම සඳහා මොහුට ඇලෙනසුළු දිවක් ඇත.

20. ගෙම්බා/මැඩියාගේ ආහාර ජීරණය ආරම්භ වන්නේ
(1) මුඛ කුහරය තුළ ය. (2) අන්නස්‍රෝතය තුළ ය. (3) ආමාශය තුළ ය.
(4) ග්‍රහණිය තුළ ය. (5) ක්ෂුද්‍රාන්ත්‍රය තුළ ය.

21. ගෙම්බා/මැඩියාගේ වෘක්කීය ප්‍රතිහාර ශිරාව සෑදීමට සම්බන්ධ වන ප්‍රධාන වාහිනී දෙක වන්නේ
(1) පෘෂ්ඨීය කටි ශිරාව සහ ශ්‍රෝණි ශිරාව ය. (2) ශ්‍රෝණි ශිරාව සහ ජංඝෙව ශිරාව ය.
(3) ජංඝෙව ශිරාව සහ කලව ශිරාව ය. (4) පෘෂ්ඨීය කටි ශිරාව සහ ජංඝෙව ශිරාව ය.
(5) පෘෂ්ඨීය කටි ශිරාව සහ කලව ශිරාව ය.

22. ගෙම්බා/මැඩියා ගේ සම
(1) ශුෂ්ක කුඩා කොරළ දරයි. (2) අධශ්චර්මීය මේද ස්තරයක් සහිත ය.
(3) බහිශ්චර්මීය සම්භවයක් සහිත ය. (4) වර්ණ වෙනස්වීමට භාජනය නොවේ.
(5) ශ්ලේෂ්මල නිපදවයි.

23. මිනිස් කපාලයේ අස්ථියක් නොවන්නේ පහත සඳහන් ඒවා අතරෙන් කුමක් ද?
(1) ලලාට අස්ථිය (2) පාර්ශ්වකපාල අස්ථිය (3) කීලාස්ථිය
(4) නාසාස්ථිය (5) ශංඛක අස්ථිය

24. මිනිසාගේ පර්ශු දරණ කශේරුකා සංඛ්‍යාව වනුයේ
(1) 4 ය. (2) 5 ය. (3) 7 ය. (4) 10 ය. (5) 12 ය.

25. මිනිසාගේ මස්තිෂ්කය පිළිබඳ පහත සඳහන් වගන්ති අතරෙන් සත්‍ය නොවන්නේ කුමක් ද?
(1) එය මොළයෙහි විශාලම කොටස වේ.
(2) එය මතකය තැන්පත් කර ඇති ස්ථානයයි.
(3) එහි සම්භවය බහිශ්චර්මීයයි.
(4) එය ඉච්ඡානුග පේශි සංකෝචනය පාලනය කිරීම හා සම්බන්ධ ය.
(5) එය අන්තරාසර්ග ග්‍රන්ථියක් ලෙස ක්‍රියාකරයි.

26. මිනිස් හෘදය පිළිබඳ පහත සඳහන් වගන්ති අතරෙන් වැරදි වගන්තිය කුමක් ද?
(1) එහි බිත්තිය ස්තර තුනකින් සමන්විත වේ.
(2) AV ගැටය ගතිකරය ලෙස බොහෝවිට ක්‍රියා කරයි.
(3) එයට කිරීටක ධමනි මගින් ඔක්සිජනීකෘත රුධිරය සැපයේ.
(4) මහාධමනි කපාටය සැදී ඇත්තේ අඩසඳ කුණ්ඩ තුනකිනි.
(5) වම් කර්ණිකාවට පුප්ඵුසීය ශිරා හතරක් විවෘත වේ.

27. මිනිස් අක්මාව
(1) දේහයේ විශාලම අවයවය වේ. (2) ඛණ්ඩිකා පහකින් සමන්විත වේ.
(3) යූරියා සංශ්ලේෂණය කරයි. (4) අන්තරාසර්ග ග්‍රන්ථියක් ලෙස ක්‍රියාකරයි.
(5) ලයිපේස් ස්‍රාවය කරයි.

28. ඔක්සිටෝසින්
(1) පූර්ව පිටියුටරිය මගින් ස්‍රාවය වේ. (2) ස්ටෙරොයිඩ හෝර්මෝනයකි.
(3) කිරි සංශ්ලේෂණය උත්තේජනය කරයි. (4) ද්විතීයික ලිංගික ලක්ෂණවල විකසනය සඳහා වැදගත් වේ.
(5) ප්‍රසූතියේ දී, ගර්භාෂයේ සංකෝචනය උත්තේජනය කරයි.

29. පෝෂී හෝර්මෝනයක් වන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?
(1) LH (2) ප්‍රොලැක්ටින් (3) කැල්සිටෝනින් (4) ඊස්ට්‍රජන් (5) ADH

30. ග්ලූකෝස් හා මේද මිශ්‍රණයක් සවායු ලෙස පරිවෘත්තියට භාජනය කළ විට ශ්වසන ලබ්ධිය විය හැක්කේ පහත සඳහන් අගයන් අතරෙන් කුමක් ද?
(1) 0.6 (2) 0.7 (3) 0.8 (4) 1.0 (5) 1.1

31. ග්ලයිකොලිසියේදී එක් ග්ලූකෝස් අණුවක් සම්පූර්ණයෙන් ඔක්සිකරණය වීමේ දී නිපදවෙන ශුද්ධ ATP අණු සංඛ්‍යාව වනුයේ
(1) 2 (2) 8 (3) 10 (4) 36 (5) 38

32. මිනිස් සමෙහි, ප්‍රබල පීඩනයන්ට සංවේදී ප්‍රතිග්‍රාහක වනුයේ
(1) රෆිනි දේහාණු ය. (2) ක්‍රවුස් අන්ත බල්බ ය. (3) මයිස්නර් දේහාණු ය.
(4) පැසිනී දේහාණු ය. (5) මර්කල් මඩල ය.

33. සාමාන්‍ය මිනිස් වෘක්කයෙහි පෙරීමේ ක්‍රියාවලියේ දී පෙරනයට ගමන් කරනුයේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
(1) රක්තාණු (2) ඇල්බියුමින් (3) ශ්වේතාණු (4) පට්ටිකා (5) ග්ලූකෝස්

34. මිනිස් ඇසෙහි කේතු
(1) ඇත්තේ එක් වර්ගයක් පමණි. (2) දෘෂ්ටිවිතානයේ ඒකාකාරී ලෙස ව්‍යාප්ත වී ඇත.
(3) වර්ණ දෘෂ්ටිය සඳහා වැදගත් වේ. (4) දෘෂ්ටි වර්ණකය ලෙස රොඩොප්සින් දරයි.
(5) අඩු ආලෝකය මගින් උත්තේජනය වේ.

35. පහත සඳහන් විටමින අතුරෙන් කුමන විටමිනයෙහි ඌනතාව මිනිස් රුධිරය කැටිගැසීම කෙරෙහි බලපෑ හැකි ද?

(1) A (2) $B_{12}$ (3) C (4) D (5) K

36. ගෙම්බා/මැඩියාගේ අළුවන් ළපද ඇති වනුයේ

(1) සංසේචනය වූ විගසම ය. (2) ප්‍රථම ඡේදනය සිදු වූ විගසම ය.
(3) දෙවන ඡේදනය සිදු වූ විගසම ය. (4) බීජාන්ත ජේනුව සැදුන විගසම ය.
(5) ස්නායු ඵලකය සැදුන විගසම ය.

37. මිනිස් ශුක්‍රාණු, දෛහික සෛලවලින් වෙනස් වන්නේ

(1) චලනය විය හැකි බැවිනි. (2) ඒකගුණ බැවිනි.
(3) මයිටකොන්ඩ්‍රියා රාශියක් දරණ බැවිනි. (4) විභාජනය වීමට නොහැකි බැවිනි.
(5) කෙළින්ම රුධිරයෙන් පෝෂණය නොවන බැවිනි.

38. මිනිස් කලලබන්ධය පිළිබඳ පහත සඳහන් වගන්ති අතරෙන් වැරදි වනුයේ කුමක් ද?

(1) එය භ්‍රෑණයේ රුධිරය සහ මවගේ රුධිරය මිශ්‍රවීමට ඉඩ සලසයි.
(2) එය හෝර්මෝන ස්‍රාවය කරයි.
(3) එය භ්‍රෑණයට ශ්වසන අවයවයක් ලෙස ක්‍රියා කරයි.
(4) එය භ්‍රෑණයට පෝෂණය සපයයි.
(5) එය භ්‍රෑණයේ බහිස්‍රාවී ද්‍රව්‍ය ඉවත් කිරීමට උපකාර වේ.

39. මෙන්ඩල්ගේ පළමුවන නියමය සම්බන්ධ වනුයේ

(1) ලිංග ප්‍රතිබද්ධ ලක්ෂණ වියුක්ත වීම සමග ය. (2) ප්‍රතිවිරුද්ධ ලක්ෂණ වියුක්ත වීම සමග ය.
(3) ඇලීල සංයෝජනය වීම සමග ය. (4) ප්‍රවේණිදර්ශ අනුපාත පවත්වා ගැනීම සමග ය.
(5) ජාන සංයෝජනය වීම සමග ය.

40. O රුධිර ගණය සහිත දරුවකුගේ පියාගේ සහ මවගේ රුධිර ගණයන් නිරූපණය නොකරන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) A සහ A (2) B සහ O (3) A සහ O (4) AB සහ O (5) O සහ O

41. මිනිසාගේ ලිංග-ප්‍රතිබද්ධ ලක්ෂණයක් වන්නේ පහත සඳහන් ඒවා අතරෙන් කුමක් ද?

(1) රැලි නොගැසුණු හිසකෙස් (2) ලා පැහැති හිසකෙස් (3) තද පැහැති සම
(4) කළු පැහැති ඇස් (5) සාමාන්‍ය වර්ණ දෘෂ්ටිය

42. මිනිසාගේ ඇසේ වර්ණය සරල මෙන්ඩලීය ඇලීල යුගලක් මගින් නිර්ණය කෙරේ. නිල් ඇස් දුඹුරු ඇස්වලට නිලීන වේ. හාඩි වයින්බර්ග් නියමයට අනුව හැසිරෙන ගහනයක පුද්ගලයින්ගෙන් 16% ක් නිල් ඇස් දරයි. මෙම ගහනයේ $F_1$ පරම්පරාවේ විෂමයුග්මකයන්ගේ ප්‍රතිශතය වනුයේ

(1) 84% ය. (2) 60% ය. (3) 48% ය. (4) 36% ය. (5) 24% ය.

43. පරිණාමය පිළිබඳ යාන්ත්‍රණයක් මුලින්ම ඉදිරිපත් කළ විද්‍යාඥයා වූයේ

(1) ජීන් බැප්ටිස්ට් ඩී ලැමාර්ක් ය. (2) චාල්ස් ඩාවින් ය. (3) ඇල්ෆ්‍රඩ් රසල් වොලස් ය.
(4) තෝමස් හක්ස්ලි ය. (5) ස්ටැන්ලි මිලර් ය.

44. පරිණාමය සඳහා අවම සාක්ෂි සපයනුයේ පහත සඳහන් ඒවායින් කුමකින් ද?

(1) වර්ගීකරණය (2) කලල විද්‍යාව (3) සංසන්දනාත්මක ව්‍යුහ විද්‍යාව
(4) සත්ත්ව චර්යා අධ්‍යයන (5) ජෛව රසායන විද්‍යාව

45. පොසිල අධ්‍යයනයක් මගින් පැහැදිලි ව පෙන්නුම් කෙරෙනුයේ පහත සඳහන් ඒවායින් කවරක් ද?

(1) සංකීර්ණ ආකාරවලට ප්‍රථම සරල ආකාර ඇතිවීම (2) පරිණාමීය වෙනස් වීමක් සඳහා හේතුවක්
(3) නව විශේෂවල සම්භවය (4) පරිණාමීය වෙනස් වීමක් සඳහා යාන්ත්‍රණයක්
(5) ජීවන සටන

46. ප්‍රවේණි ප්‍රභේදනයට දායක නොවන්නේ පහත සඳහන් ඒවායින් කවරක් ද?

(1) ස්වාධීන සංරචනය (2) සමජාත වර්ණදේහවල යුගලනය වීම (3) අවකරණය
(4) වර්ණදේහවල මැකීම (5) ඛණ්ඩ ආදේශ වීම

47. මිනිස් පරිණාමයේ දී

(1) පූර්ව ගාත්‍රා දිගින් වැඩි විය. (2) හිස් කබලේ පෘෂ්ඨය රළු විය.

(3) දත්වල විශාලත්වය අඩුවිය. (4) හනු දිගින් වැඩි විය.

(5) ද්විනේත්‍රික දෘෂ්ටිය වර්ධනය විය.

48. පරිසර පද්ධතියක් නොවන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කවරක් ද?

(1) මී මැසි ජනාවාසයක් (2) කුණු වී යන මළකුණක් (3) අඹ ගසක්

(4) ගොම ගොඩක් (5) දිරායන ලී කොටයක්

49. පරිසර පද්ධතියක ශක්තිය පිළිබඳ ව පහත සඳහන් වගන්ති අතුරෙන් අසත්‍ය වනුයේ කුමක් ද?

(1) ශක්තිය ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ය.

(2) පරිසර පද්ධති සංසන්දනය කිරීම සඳහා ශක්ති පිරමිඩ භාවිත කෙරේ.

(3) සමහර ශක්ති පිරමිඩ යටිකුරු වේ.

(4) ආහාර දාමයක් ඔස්සේ සෑම පියවරක දී ම ශක්ති හානි වීමක් සිදුවේ.

(5) පරිසර පද්ධතියකින් ශක්තිය හානි වනුයේ තාපය ලෙසට ය.

50. පරිසර පද්ධතියක ද්විතීයික පරිභෝජකයන්ගේ සංඛ්‍යාව වැඩි වීම මගින්

(1) ප්‍රාථමික නිෂ්පාදකයින්ගේ බහුලතාව වැඩි විය හැකි ය.

(2) ප්‍රාථමික පරිභෝජකයන්ගේ බහුලතාව වැඩි විය හැකි ය.

(3) තෘතීයික පරිභෝජකයන්ගේ බහුලතාව අඩු විය හැකි ය.

(4) වියෝජකයන්ගේ බහුලතාව වැඩි විය හැකි ය.

(5) පරිසර පද්ධතියේ බිඳ වැටීමක් සිදු විය හැකි ය.

● 51 සිට 53 දක්වා වූ ප්‍රශ්න මිරිදිය පොකුණු පරිසර පද්ධතියක පැය 12 ක කාලයක් තුළ සමහර පරාමිතියන්ගේ විචලනාවන් පෙන්වන පහත සඳහන් ප්‍රස්තාර මත පදනම් වී ඇත.




51. ප්‍රාථමික නිෂ්පාදනතාවෙහි විචලනාව පෙන්නුම් කළ හැක්කේ ඉහත සඳහන් කුමන ප්‍රස්තාරය මගින් ද?

(1) A (2) B (3) C (4) D (5) E

52. දිය වී ඇති කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයෙහි විචලනාව පෙන්නුම් කළ හැක්කේ ඉහත සඳහන් කුමන ප්‍රස්තාරය මගින් ද?

(1) A (2) B (3) C (4) D (5) E

53. දිය වී ඇති ඔක්සිජන් ප්‍රමාණයෙහි විචලනාව පෙන්නුම් කළ හැක්කේ ඉහත සඳහන් කුමන ප්‍රස්තාරය මගින් ද?

(1) A (2) B (3) C (4) D (5) E

54. පොකුණුවල මසුන් වගා කිරීමේ දී පොහොර භාවිත කරනුයේ ප්‍රධාන වශයෙන් ම
   (1) වගා කරන ජීවීන්ට පෝෂ්‍ය ද්‍රව්‍ය කෙළින්ම ලබාදෙන ප්‍රභවයක් ලෙස ය.
   (2) ජලයෙහි ආම්ලිකතාව අඩු කිරීම පිණිස ය.
   (3) ශාක ප්ලවාංගවල බහුලතාව වැඩි කිරීම පිණිස ය.
   (4) අහිතකර විශේෂ ඉවත් කිරීම සඳහා ය.
   (5) විශාල ජලජ ශාකවල වර්ධනය වැඩි කිරීම සඳහා ය.

55. මිරිදිය බහුරෝපණය සඳහා සුදුසු මත්ස්‍ය විශේෂ සංකලනයක් වනුයේ
   (1) කණඝොළ කාපයා සහ සාමාන්‍ය කාපයා ය.
   (2) හිස ලොකු කාපයා සහ යෝධ ගුරාමියා ය.
   (3) හිස ලොකු කාපයා සහ නයිල් තිලාපියා ය.
   (4) වේක්කයා සහ නයිල් තිලාපියා ය.
   (5) සාමාන්‍ය කාපයා සහ කෙල් ගොඩයා ය.

56. පොල් කළු කුරුමිණියා පිළිබඳව පහත සඳහන් වගන්ති අතරෙන් සත්‍ය වනුයේ කුමක් ද?
   (1) හිසේ අඟක් වැනි ව්‍යුහයක් ඇත්තේ ගැහැණු සත්වයාට පමණි.
   (2) මොහුට සපන හා විකන මුඛ කොටස් ඇත.
   (3) පුහුණිලා මේරූ පොල් අතුවලට හානි පමුණුවයි.
   (4) මොහුගේ කීටයා ජීවත් වනුයේ සජීවී පොල් කඳන් තුළ ය.
   (5) මොහු ප්‍රධාන වශයෙන් පාලනය කරනු ලබන්නේ කෘමි පරපෝෂිතයකු භාවිතයෙනි.

57. *Plasmodium vivax* ගේ වාහකයා ප්‍රධාන වශයෙන් අභිජනනය කරනුයේ
   (1) දූෂණය වූ ජලය රැඳී ඇති කාණුවල ය.
   (2) වැසි ජලය සහිත බඳුන් තුළ ය.
   (3) වේගයෙන් ගලායන ගංගා වල ය.
   (4) හිරු එළිය වැටෙන පිරිසිදු මිරිදිය කඩිතිවල ය.
   (5) ජලජ ශාක ආශ්‍රිත ව ය.

58. මිනිසාගේ කොකු පණු ආසාදනය අවම කර ගත හැක්කේ
   (1) වැසිකිළි භාවිතය මගිනි.
   (2) තම්බා ගත් ජලය පානය කිරීම මගිනි.
   (3) කෑමට පෙර සබන් දමා අත සෝදා ගැනීම මගිනි.
   (4) වැසිකිළි යාමෙන් පසු සබන් දමා අත් සෝදා ගැනීම මගිනි.
   (5) ආහාර මැස්සන්ගෙන් ආරක්ෂා කර ගැනීම මගිනි.

59. ශ්‍රී ලංකාවේ අද සිදු කරනු ලබන වෙරළාසන්න ජල රෝපණය පිළිබඳ පහත සඳහන් වගන්ති අතරෙන් සත්‍ය වනුයේ කුමක් ද?
   (1) කිවුල් දිය මත්ස්‍ය විශේෂ පමණක් වගා කරනු ලබයි.
   (2) නිපදවන මුළු ප්‍රමාණය ම අපනයනය කෙරේ.
   (3) එය පාරිසරික ගැටලු රැසක් ඇති කරයි.
   (4) ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමයක් ලැබෙනුයේ මෙහි නිෂ්පාදනය මගිනි.
   (5) මෙය වෙරළාසන්න පරිසර පද්ධති කළමනාකරණය සඳහා උපකාරී වේ.

60. මිනිසාගේ පහත සඳහන් ක්‍රියාවන් අතරින් වර්තමානයේ සිදුවන ජෛවවිවිධත්ව හානිය සඳහා වැඩි වශයෙන්ම දායක වන්නේ කවරක් ද?
   (1) වාසස්ථාන විනාශ කිරීම
   (2) ප්‍රමාණය ඉක්මවා දඩයම් කිරීම
   (3) විදේශීය විශේෂ හඳුන්වා දීම
   (4) ක්ලෝරෝෆ්ලුවොරොකාබන් භාවිත කිරීම
   (5) පොසිල ඉන්ධන දහනය කිරීම